කොවිඩ් ව්‍යාප්තිය




★ දිනමිණ
The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ දුරුතු පුර තෙළෙස්වක ලත් කුජ දින | කාණ්ඩය 112 | පත්‍රය 35 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 ජනවාරි 26 අඟහරුවාදා




සතියේ ළමයා පොතේ පොතට බද්දර මල්ල අද පත්‍රය සමඟ

# නව ව්‍යවස්ථා සංශෝධනය

## දැනටමත් කෙටුම්පත් වෙනවා

අධිකරණ පියසට මුල්ගල තබමින් අගමැති කියයි



පිට 06

# වතු කම්කරු දෛනික වැටුප රු. 1,000ක් කිරීමට කැබිනට් අනුමැතිය

ධනුෂ්ක ගොඩකුඹුර

වතු කම්කරුවන්ගේ අවම දෛනික වැටුප රුපියල් දහසක් කිරීම පඩි පාලක සභා හරහා ක්‍රියාත්මක කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (25) රැස් වූ කැබිනට් මණ්ඩලය තීරණය කළේය.

පිට 06



## කෝටි 236ක ආයෝජනයකින් කටුනායක ගුවන්තොටේ අපනයන භාණ්ඩ පර්යන්ත ගොඩනැඟිල්ල ඉදි කෙරෙයි

පිට 06

## නව අධිකරණ සංකීර්ණයේ වැඩ අරඹමින්...



## සජබයේ ප්‍රථම කෘත්‍යාධිකාරී මණ්ඩලය පත් වෙයි

උපාලි කරුණාරත්න, පහන් විජේසේකර

සමගි ජන බලවේගයේ ප්‍රථම කෘත්‍යාධිකාරී මණ්ඩලය ඊයේ (25) පෙරවරුවේ රැස් වූ අතර, එහිදී පක්ෂයේ නව නිලධාරී මණ්ඩලයක් පත් කරගෙන තිබේ.

මෙම කෘත්‍යාධිකාරී මණ්ඩලය විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ ප්‍රධානත්වයෙන් ඇතුල්කෝට්ටේ පිහිටි සමගි ජන බල-වේගය පක්ෂ මූලස්ථානයේදී රැස් වී ඇත.

කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තීරණය අනුව සමගි ජන බලවේ-ගයේ නායකත්වය විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාට හිමි වී තිබේ.

පිට 06

## විශ්‍රාම වැටුප් වර්ධක අත්හිටුවීමට එරෙහි පෙත්සම මාර්තු 14 දාට

නෙල්කා මැදගෙදර

විශ්‍රාම වැටුප් විසමතා ඉවත් කරන තෙක් විශ්‍රාමිකයන්ට හිමි විය යුතු විශ්‍රාම වැටුප් වර්ධක අත්හිටුවීමට රජය ගෙන ඇති තීරණය බල රහිත කරන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති පෙත්සම සලකා බැලීම සඳහා ...ර්තු මස 14 වනදා කැඳවීමට ...යාචනාධිකරණය ඊයේ(25) ...ම කළේය.

පිට 06

## වතුකරයට ලයින් කාමර වෙනුවට තට්ටු නිවාස

ධනුෂ්ක ගොඩකුඹුර

මේ දක්වා ක්‍රියාත්මක කරන ලද වතු නිවාස යෝජනා ක්‍රම සමස්ත වැවිලි ප්‍රජාවට වැඩි ප්‍රතිලාභ ලැබෙන ආකාරයට සංශෝධනය කිරීමට රජයේ අවධානය යොමුව තිබේ.

පිට 06






## ඇමැති රෝහිතට එරෙහි නඩුව නිසි පරිදි පවරා නෑ

මූලික විරෝධතාවක් ඉදිරිපත් කරනවා

පිට 06

ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස



06



## මන්ත්‍රී වසන්තටත් කොරෝනා

සුභාෂිණී සේනානායක

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත යාපා බණ්ඩාර මහතාට කොවිඩ් -19 ආසාදනය වී ඇති බවට සෞඛ්‍ය අංශ තහවුරු කර තිබේ.

පිට 06

## ඇවන්... සභා... එරෙහි නඩුව පෙබරවාරි 01 කැඳවයි

කුමුදු හෙට්ටිආරච්චි

ඇවන්ගාඩ් නමැති නෞකාව තුළ නීත්‍යානුකූල බල-පත්‍රයක් හෝ අවසර පත්‍රයක් ...

## ආදායම් බදු අය කරන්න

2021 වර්ෂයෙ ආදායම් බදු ලෙස රුපියල් කෝටි 57,550ක් අය කිරීමට ආදායම් බදු දෙපාර්තමේන්තුවට මුදල් අමාත්‍යාංශය විසින් නියෝග කර ඇති බව එම දෙපාර්තමේ-න්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් එච්. එම්.ඩබ්ලිව්.සී බණ්ඩාර මහතා ඊයේ (25) දින-මිණට පැවසීය.

පිට 06

මුදල් අමාත්‍යාංශයෙන් ආදායම් බදු දෙපාර්තමේන්තුවට නියෝග

## ෆුල් ෆේස් හෙල්මට් දාගෙන ඇවිත් පල්ලෙමුල්ලේදී අයකුට වෙඩි තියලා

රක්ෂණ ශ්‍රියන්ත




## සුව වූ පිරිස 50,000 පනී



## නව ආසාදිතයෝ 843ක්